# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.02 පැය 0530 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1975 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. අපරාධ රැසකට වරෙන්තු නිකුත් වී සිටි සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.11.01 වන දින උදෑසන කාලයේදී මෝදර පොලිස් වසමේ ලෙල්ලම ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් ග්‍රෑම් 26 මිලිග්‍රෑම් 890 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මෝදර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 25 ක් වන සමිත්පුර, මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී අපරාධ රැසකට වරෙන්තු නිකුත් වී සිටි සැකකරුවෙකු බවටත් අනාවරණය විය.

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. කේරළ ගංජා සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පේදුරුතුඩුව පොලිස් ස්ථානය.**

2025.11.01 වන දින සවස් කාලයේ පේදුරුතුඩුව පොලිස් වසමේ පුලෝලි බටහිර ප්‍රදේශයේදී පේදුරුතුඩුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකටයුතු නිවසක් පරීක්ෂා කර කේරළ ගංජා කිලෝ 104 ග්‍රෑම් 660 ක් අඩංගු පාර්සල් 45 ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 47 ක් වන පේදුරුතුඩුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පේදුරුතුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.**

2025.11.01 වන දින සවස් කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ තිහාරිය ප්‍රදේශයේදී කොළඹ දෙස සිට මහනුවර දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව හා යතුරුපැදිකරු වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමේදී පදික කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 61 ක් වූ තිහාරිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - තලාව පොලිස් වසම.

2025.11.01 වන දින රාත්‍රී කාලයේ තලාව පොලිස් වසමේ තලාව 419 ගම්මානය මාර්ගයේ නව හඟුරන්කෙත හන්දිය ප්‍රදේශයේදී 419 ගම්මානය දෙස සිට තලාව දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි අත්ට්‍රැක්ටර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු, අත්ට්‍රැක්ටරයේ ගමන් කල පුද්ගලයෙකු හා දරුවෙකු තුවාල ලබා අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමේදී යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ හිඟුරුවැව, තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - හෙට්ටිපොල පොලිස් වසම.

2025.11.01 වන දින අළුයම් කාලයේ හෙට්ටිපොල පොලිස් වසමේ හලාවත කුරුණෑගල මාර්ගයේ තෝරගල්ල ප්‍රදේශයේදී හලාවත දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ මැදදමුව, බිංගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හෙට්ටිපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - පුත්තලම පොලිස් වසම.

2025.11.01 වන දින රාත්‍රී කාලයේ පුත්තලම පොලිස් වසමේ පුත්තලම අනුරාධපුරය මාර්ගයේ සිරම්බිඅඩිය ප්‍රදේශයේදී අනුරාධපුර දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ ලොරි රථයක් ඊට ඉදිරියෙන් එම දිශාවටම ධාවනය කල තවත් ලොරි රථයක පිටුපස ගැටී එහි පිටුපස ගමන් කල කාන්තාවන් සිව්දෙනෙකු මාර්ගයට ඇද වැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාවන් සිව්දෙනා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී එක් කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 55 ක් වූ එරුක්කලම්පිට්ටි, මන්නාරම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**